සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**10 ශ්‍රේණිය** | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | **21 S I**

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

**කාලය පැය දෙකයි**

සැලකිය යුතුයි :- ●සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
●අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

★ **අංක 1 සිට 3 තෙක් ප්‍රශ්න වල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.**

01. සමන්මලීගේ **ඔළුව ඉදිමිලා** යයි ඇගේ යෙහෙළිය පවසන්නීය.
1. හිසේ අමාරුවක් හැදිලා 2. අහංකාර වෙලා
3. තනතුරක් ලැබිලා 4. රැකියාව අහිමිවෙලා

02. **දිවෙන් දිව ගාගෙන සිටි** මිත්‍රයාගේ වියෝව සිරිදාසට දරාගත නොහැකි විය.
1. ධනවතෙකු ව සිටි 2. ඥාතිවරයෙකු ව සිටි
3. සතුරෙකුව සිටි 4. ඉතා ලෙන්ගතුව සිටි

03. ගුරුතුමිය කළ යෝජනාවට සිසුහු **එක පයින්** කැමති වූහ.
1. පහසුවෙන් ම 2. ස්ථිරව ම 3. අකමැත්තෙන් ම 4. දුවගෙන පැමිණ

★ **අංක 4 සිට 6 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන් වලට වඩාත් ගැළපෙන පදය තෝරන්න.**

04. ත්‍රස්තවාදීන්ගෙන් රට බේරා ගැනීමට ත්‍රිවිධ හමුදාව දූරූ .................................. කිසිදා අමතක කළ නොහැකිය.
1. ප්‍රගතිය 2. ප්‍රයත්නය 3. ප්‍රදානය 4. ප්‍රණාමය

05. ශ්‍රී ලංකාව විදේශීය ................................................ මුදවා ගැනීමට සටන් වැදුණු නායකයෝ සදා අමරණීය වෙති.
1. ආධිපත්‍යයෙන් 2. ග්‍රහනයෙන් 3. ගවේෂණයෙන් 4. රාජාඥාවෙන්

06. මහාචාර්ය සේනක බිබිලේ ශ්‍රී ලංකාවට ගැළපෙන ඖෂධ ................................................................ සැලසුම් කළේය.
1. ප්‍රතිපත්තියක් 2. ප්‍රතිපක්ෂයක් 3. ප්‍රති නිර්මාණයක් 4. ප්‍රතිරූපයක්

07. අකාරාදී පිළිවෙල නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
1. සුභානි, බුද්ධිකා, ලක්ෂිකා, මයුරි 2. ලක්මිණි, කවිෂාණි, සමිතා, ක්‍රිශානි
3. කවීතා, ගගනි, ධම්මි, පූජානි 4. පාරමී, කුෂානි, ක්‍රිෂ්මා, හද්‍රා

★ **අංක 8 සිට 9 තෙක් ප්‍රශ්නවල සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.**

08. 1. අබිෂේක, අනාරක්ෂිත, අනභිමුක, අභිවෘද්ධිය
2. ආරෝහන, වයෝවෘද්ධ, සංශෝධන, අදෝ ලිපි
3. මනශ්කාන්ත, චක්‍රලේඛන, උපේක්ෂා, කර්කෂ
4. ගෞරවාර්ථ, සම්බන්ධය, අභිෂේක, අනාරක්ෂිත

09. 1. ලේඛනය, උදාහරණ, ඖෂධ, වෛවර්ණ 2. වර්ධනය, සංස්ථාව, සජ්ඣායනය, සමස්ථ
3. සම්ප්‍රධාය, ප්‍රශ්ණය, භක්ත්‍යාදරය, අභිප්‍රාය 4. මර්ධනය, අබිෂේකය, ප්‍රධානය, දෙපාර්තමේන්තුව

10. ස්වරාදේශ සන්ධියට නිදසුනක් වන්නේ,
1. මිණිබරණ 2. මැදගිල්ල 3. පරමේෂ්වර 4. සන්නිවේදන



EXAMRESULTS.LK

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය වන්නේ,
   1. කාන්තාවෝ , වෙළෙන්දෝ, දරුවන්, සමහරු
   2. ඇතැමුන්, අඟනක, දරුවෙකු, පක්ෂීන්
   3. ගවයෝ, සියොත් හු, වෛද්‍යවරු, ළමයි
   4. වෛද්‍යවරුන්, සිංහලයන්, කම්කරුවෝ, අයෙක්

12. එක් එක් පේළියේ මුලින් දක්වෙන පදයට සමානාර්ථයක් නොදෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.
   1. හිරු- දිනිසුරු, දිනමිණ, දිවාකර, දිනකර
   2. අහස - ගුවන, නබෝගැබ, අඹර, ගගනතලය
   3. නෙළුම - තඹර, පංකජ, අරවින්ද, සහස්පත
   4. ගොයුම් - සුගත්, දසබල, සර්වඥ, සහසැස්

13. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇති වරණය තෝරන්න.
   1. ආකුල - ව්‍යාකුල
   2.ආවරණය - නිරාවරණය
   3. පොළව - වසුන්දරා
   4. ගරු - බුහුමන්

14. මුලින් දී ඇති ක්‍රියාපද වර්ගයට අයත් පද පමණක් සහිත වරණය තෝරන්න.
   1. මිශ්‍ර ක්‍රියා - නගිමින්, ගය ගයා, වැස්සොත්, බලමින්
   2. විධි ක්‍රියා - කියග, හිඳිනු, කියත, නට නටා
   3. අසම්භාව්‍ය ක්‍රියා බලත, යද්දී, නැගෙද්දී, කළොත්
   4. පූර්ව ක්‍රියා - හඬා, කපා, බලමින්, නැඟිට

★ **අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි කොටසේ අර්ථය නිවැරදිව දක්වෙන වරණය තෝරන්න.**

15. භාෂාවේ විවිධ ස්වරූප <u>සුසංයෝජනය</u> කරගනිමින් කාව්‍යෝක්තීන් නිර්මාණය කරගනු ලැබේ.
   1. මැනවින් පෝෂණය
   2. මැනවින් සංයෝජනය
   3. මැනවින් පුරුදු පුහුණු
   4. පුදුම උපදවන්නා දේ

16. <u>සින්දුපමාන</u> වැව් තලා මතින් ඇදී - පද්ම රේණුයෙන් සුගන්ධ වී
   1. සාගරය හා සමාන
   2. විශාල ඇළ මාර්ග
   3. රිදීවන් ජල ධාරාව
   4. ගංගාවන් සේ ඇදී

17. "තා <u>සොළස් කළක්</u> රා පොවා මත් කරන්නාහු අනෙක්හු ගන්නට කළා හු නොවෙති. මා ගන්නට කළහැ."
   1. කළගෙඩි හතළිස් දෙකක්
   2. කළගෙඩි දොළහක්
   3. කළගෙඩි පහළොවක්
   4. කළගෙඩි දාසයක්

18. නිවැරදි අර්ථය දෙන වරණය තෝරන්න.
   1. වාලිකාංගණය - වැලිමළුව, පුෂ්පධාන, - මල් ආසනය
   2. බෝධිඝරය - බෝධි ප්‍රාකාරය, චෛතියඝර, පිළිමගෙය
   3. පටිමාඝර - පිළිමගෙය , හත්ථි ප්‍රාකාරය, ඇත් කුළුණ
   4. ස්තූපය - ආරාමය, ශ්වේත ඡත්‍රය, සුදු කොඩිය

19. රූපය, සිඟිති, රාවණා, වැනුම් යන පදවල පළමු අක්ෂරයේ යෙදී ඇති පිල්ලම් නිවැරදිව දක්වෙන වරණය තෝරන්න.
   1. දීර්ඝ ඇදය, ඉස්පිල්ල, ඇලපිල්ල, ඇදය
   2. දීර්ඝ පාපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල, ඇදය
   3. දීර්ඝ පාපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල, පාපිල්ල
   4. දීර්ඝ ඇදය, ඇලපිල්ල, ඉස්පිල්ල, පාපිල්ල

20. පහත සඳහන් වාක්‍ය අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. "තොමෝ" යනු ස්ත්‍රී ලිංග බහු වචන නාම පදයකි.
   2. ප්‍රශ්නවාචී යෙදුම් හා බැඳෙන නාම අනුක්ත වේ.
   3. ඇත නැත රූප වර නැඟී වාක්‍යයක යෙදෙන කළ ඊට සම්බන්ධ කර්තෘ අනුක්ත රූප ගනී.
   4. කර්මකාරක වාක්‍යයක කර්ම පදය අනුක්ත වේ.

21. යුගල පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   1. කාසි-පනම්, හොඳ-නරක, වන අලි, දක්ෂ පක්ෂ
   2. ඇඳුම් - පැළඳුම්, රට තොට, කෙත්වතු, නාන තොටේ
   3. ළමයි බමයි, හතුරු - මිතුරු, හරක බාන, දනි පනි
   4. කොට්ට - මෙට්ට, විහාර-මළුව, ගෙවල්-දොරවල්, වංහුං

22. අව්‍ය පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
   1. කැටුව, පමණ, විතර, සා
   2. විනා, උප, අප, සතුට
   3. අදි, තෙක්, තුරු, එම්බල
   4. වහා, දක්වා, සුදන, නොහොඳ

23. පහත සඳහන් අක්ෂර ගැලපීමෙන් නිර්මාණය වන නිවැරදි ග්‍රන්ථ නාමය තෝරන්න.
1. ලි ක ග යු ය    2. ගා යු න් ත ර    3. පෙ ලි ම් ග ය    4. වි ග රා ග ය

24. A - ආකස්මිකව - ඇසුරු කිරීම    B - වැරටිල්ලා - වියළි ගොම කැලි
C - සතතාභ්‍යාස - පෙර නොවූ චමත්කාරය    D - සිව් සඟරාවත - සතර සංග්‍රහ වස්තු
ABCD යෙදුම් යුගල අතරින් නිවැරදි පද යුගලය වන්නේ,
1. A හා B    2. A හා C    3. C හා D    4. B හා D

★ අංක 25 සිට 27 දක්වා ඇති එක් එක් ප්‍රකාශයෙහි අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

25. අනවශ්‍ය දෙයක් කිරීමට ගොස් කරදරයක වැටීම.
1. වඳුරා කුඤ්ඤය ගැලෙව්වා වගෙයි.    2. කටුස්සාගේ කරේ රත්රන් බැන්දා වගෙයි.
3. කබලෙන් ළිපට වැටුණා වගෙයි.    4. දිය යටින් ගින්දර ගෙනියන්නා වගෙයි.

26. විමසිල්ලෙන් තොරව අන්‍යයන් අනුගමනය කිරීම
1. කොටි වලිගය අල්ලා ගත්තා වගෙයි.    2. දුවන්නන් පස්සේ කෙට එළදෙනත් දිව්වා වගෙයි
3. දොරටු පාලයා රජ වුණා වගෙයි.    4. ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගෙයි.

27. කියන තරමට වැඩ කෙරෙන්නේ නැත.
1. හොරාගේ අම්මගෙන් පේන ඇහැව්වා වගෙයි.    2. අගේ ඉඳන් කන කනවා වගෙයි.
3. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගෙයි.    4. කටින් බතල කොළ සිටවනවා වගෙයි.

28. පහත සඳහන් වාක්‍යවල හිස්තැන් සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනු පිළිවෙළ කුමක් ද?
E - නැවත    F - නොහොත්    G- පිළිබඳ    H -සඳහා
A - නැන්දාගේ අනපේක්ෂිත පැමිණීම ...................................... නිවැසියෝ කතාබහේ යෙදුණහ.
B - අම්මා .................................. තාත්තා මා බලන්නට එන්නේ ය.
C - .............................................. දන්වන තුරු රැස්වීම කල්තබා ඇත.
D - දරුවන් ................................ යෝග්‍ය පොත්පත් සුලබය.
1.GFEH    2. HEFG    3. FGHE    4. GHFE

29. ඔයනවා, කොකිස්, කුදහප, හොටබරියා යන සුවිශේෂී ව්‍යවහාරයන් සඳහා භාවිත කරන පොදු ව්‍යවහාරයන් පිළිවෙළින් ඇතුළත්ව ඇති වරණය තෝරන්න.
1. වල් ඌරා, කිරි අල, බුදිය ගනිං, ලෙලි ගහනවා    2. කිරිඅල, බුදියගනිං, වල්ඌරා, ලෙලි ගහනවා
3. ලෙලි ගහනවා, කිරි අල, බුදියගනිං, වල්ඌරා    4.බුදියගනිං, කිරි අල, ලෙලි ගහනවා, වල් ඌරා

★ 30 සිට 33 දක්වා වූ ප්‍රශ්න වල වාක්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

30. 1. කෙනෙක් උදෑසනම වෙළඳපල වෙත පියනඟයි.
2. හෙතෙම රැස්වීමට සහභාගි වූවාය.
3. කුඩලිගම මහතා "සංවාදය" පද්‍ය ග්‍රන්ථය රචනා කළහ.
4. අපි සියල්ලෝම ශ්‍රී ලාංකික පුරවැසියෝ වෙමු.

31. 1. ශිෂ්‍යයෝ පන්තියට නොඑන්නේ ඇයි?
2. පොලිස් භටයන් විසින් සොරු අත්අඩංගුවට ගනු ලැබූහ.
3. මම විභාගයෙන් සමත් වේවි.
4. සියලු සත්වයෝ නිදුක් වේවා.

32. 1. අයෙක් සංග්‍රහශීලී වෙයි.
2. අග්‍රාමාත්‍යතුමා විදේශීය නියෝජිතයන් හමුවෙති.
3. දරුවන් සෙල්ලම් කරති'යි අම්මා සිතුවාය.
4. ළමයා හෝ නුඹ හෝ තරඟයේ ජයග්‍රාහකයා වෙති.

33. 1. මේ පන්තියේ ළමයින් නැත.    2. පයින් යන්නෝ දකුණු පසින් යා යුත්තාහ.
3. අපි ජයග්‍රහණය ලබා ගන්නේ කෙසේද?    4. මදුරුවෝ මෙන්ම මැස්සෝ ද රෝග බෝ කරයි.

34. නිර්මාණකරණයේ දී 'ප්‍රතිභාව' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
1. නිතර නිතර අභ්‍යාසයේ යෙදීම.
2. නිර්මාණයක සැඟවී ඇති අර්ථයයි.
3. අපූරු වස්තු නිර්මාණය කිරීමේ හැකියාවයි.
4. යම් වස්තුවක් ඇති තත්ත්වය ඉක්මවා වර්ණනා කිරීමයි.

35. පහත සඳහන් ප්‍රකාශ උපුටාගත් පාඩම් අනුපිළිවෙලින් දක්වෙන වරණය වන්නේ,
1. අනඳ පහවැ යා
2. ළමයෝ ඉක්මනට ගෙදර දුවපං
3. නැහැ අපි ඔක්කොම දිනුවා
4. සර්ලා ළඟදී නේද මේ ගෙදට්ට ආවේ.

1. එතෙපුල් අමා හැල්ලෙන්, තොරොක්කෝව, පුවත්පත් විශේෂාංග ලිපි, මං තනන්නෝ
2. පුවත්පත් විශේෂාංග ලිපි, තොරොක්කෝව, මං තනන්නෝ, එතෙපුල්, අමා හැල්ලෙන්
3. තොරොක්කෝව, පුවත්පත් විශේෂාංග ලිපි, මං තනන්නෝ, එතෙපුල් අමා හැල්ලෙන්
4. තොරොක්කෝව, මං තනන්නෝ, එතෙපුල් අමා හැල්ලෙන්, පුවත්පත් විශේෂාංග ලිපි

36. පහත සඳහන් පද්‍යයෙහි හිස්තැන සඳහා සුදුසු පද්‍ය පාඨය වන්නේ,

හැම ගනඳුරු බොහ වර නිසයුරා — ගත
පහත් බැවින් පිටතට සස ලෙසින් — වත
...................................................................
කලදෝ කැට තෙලෙත දිසි වැනි පැහැ — දිමුත

1. තර පතරින් සඳ'දර තර පහර — දෙත
2. පුල් නිලුපුල් සම් පින් කතක — වුවනත
3. සැදෑ සඳුට සදමින් මග නිසා — කත
4. උදය'ග රැක සඳමල් කැනක සිරි — ගත

37. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නාට්‍යයක් නොවන්නේ
1. නරිබෑණා
2. රත්තරන්
3. මනමේ
4. කදා වළලු

38. "රත්නදීප ජන්ම භූමි - ලංකාදීප විජය භූමි" යන ගීතයෙහි රචකයා වන්නේ,
1. මඩවල එස් රත්නායක මහතා
2. මහගමසේකර මහතා
3. රත්න ශ්‍රී විජේසිංහ මහතා
4. ඩබ්ලිව්. ඩී. අමරදේව මහතා

★ **අංක 39 සිට 40 තෙක්ප්‍රශ්න සඳහා මුලින් ඉදිරිපත් කර ඇති අර්ථය සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

39. රජය විසින් කරනු ලබන පරීක්ෂණ ඒ ඒ ආයතන තුළම සිරවන බව ඇතැම් දේශපාලනඥයෝ පවසති.
1. රජය පරීක්ෂණ කරන බව දේශපාලඥයෝ පවසති.
2. ඇතැම් පරීක්ෂණ ආයතන විසින් සඟවා ගනියි.
3. රජය විසින් කරනු ලබන පරීක්ෂණ ඇතැම් අය සඟවා ගනියි.
4. රජය විසින් කරනු ලබන පරීක්ෂණවල සත්‍ය තොරතුරු එම ආයතනය සඟවන බව දේශපාලඥයෝ පවසති.

40. පුස් කොළවලට සීමා වූ පැරණි ගද්‍ය සාහිත්‍ය කෘති ද මුද්‍රණද්වාරයෙන් නිකුත් වේ.
1. නව ගද්‍ය සාහිත්‍ය කෘති මෙන්ම පැරණි කෘති ද මුද්‍රණය වේ.
2. පැරණි ගද්‍ය කෘති පුස්කොළවලට සීමා වුව ද වර්තමානයේ මුද්‍රණය වේ.
3. මුද්‍රණය වන්නේ පැරණි සාහිත්‍ය කෘති පමණක් නොවේ.
4. වර්තමාන ගද්‍ය කෘති පමණක් මුද්‍රණය වේ.

* * * * * *

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved



| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 21 S II |
|---|---|---|

සිංහල භාෂාව හා සාහිත්‍යය - II — කාලය පැය දෙකයි

සැලකිය යුතුයි :- ● සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(01) අංක i සිට x දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් පහත සඳහන් අක්ෂර කාණ්ඩ දෙක නම් කරන්න.
(අ) ෂ, ශ, ස,හ, ෆ (ආ) ඞ, ඤ,ණ, න , ම

ii. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. එම වචන දෙක පමණක් නිදොස් කොට ලියන්න.

විශේශාංග ලිපියක්, ප්‍රවෘත්තියක් හෝ වාර්ථාවක් හෝ සමාජ වැදගත්කමකින් යුක්ත වෙනත් මුලාශ්‍රයක් ද පදනම් කොටගනිමින් සම්පාදනය කළ හැකිය.
(අ) .............................................................. (ආ) ......................................................................

iii. පහත සඳහන් විසන්ධි පද සන්ධි කොට ලියා සන්ධි නාමයද ලියන්න.
(අ) නි + අවුල් (ආ) නෙළුඹු + මල්

iv. පහත සඳහන් පද්‍ය පාඨයන්හි ඉරි ඇඳි පද අයත් ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) <u>කියන</u> උන් මෙතෙපල - ආයේ ඇඳුරු ගුත්තිල
(ආ) <u>කියන්න</u> සුළඟේ - ඔබ කොයි සිට දෝ එන්නේ

v. "ප්‍රථම" යන ප්‍රකෘතියට "ඉක" ප්‍රත්‍යය එකතුවීමෙන් "ප්‍රාථමික" යන්න සෑදෙන්නාක් මෙන් පහත ප්‍රකෘති පද සඳහා "ඉක" යන්න යෙදෙන පද ලියන්න.
(අ) භූමි + ඉක (ආ) දින +ඉක

vi. පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය කර්ම කාරක වාක්‍ය ලෙස සකස් කරන්න.
(ආ) මම සෑම විටම ගුරුවරුන් අගය කරමි. (ආ) කම්කරුවෝ පාලම තනා නිම කළහ.

vii.පහත දී ඇති වාක්‍ය කණ්ඩයට යෙදිය හැකි තනි පද ලියන්න.
(ආ) සියලු කලාවන්ට අධිපති දෙවඟන (ආ) කොළ (ගොයම්) මඬින ස්ථානය

viii.පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් නිපාත පදයක් හා උපසර්ග පදයක් උපුටා ලියන්න.
ඉංජිනේරු ශිල්පයේ විශිෂ්ටතම නිර්මාණයක් ලෙස සීගිරි බලකොටුව හැඳින්විය හැක.
(අ) .............................................................. (ආ) ......................................................

ix. පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කොට ලියන්න.
(ආ) සිසුහු තිදෙනෙකු විශිෂ්ටතම සම්මාන හිමි කරගත්හ.
(ආ) ඕ තොමෝ ආදරයෙන් මව්පියෝ රැකබලා ගත්තෝය.

x. පහත සඳහන් ප්‍රාදේශික ව්‍යවහාර පද සඳහා පොදු ව්‍යවහාරයේ භාවිත පද ලියා දක්වන්න.
(අ) අලියන් වේලාව - (ආ) පුහුල් -

(02) පහත දැක්වෙන අ,ආ,ඉ,ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) නූතන විද්‍යාත්මක දියුණුව නිසා බිහි වූ යන්ත්‍ර සූත්‍ර මඟින් මිනිසා අද වසර ගණනාවක් ඉදිරියෙන් සිටී. එයින් මිනිසා ලද ජයග්‍රහණ බොහෝය. එහෙත් මෙම යන්ත්‍ර නිපදවන්නේ මිනිස් මොළය බැවින්, මිනිසා විසින් තැනූ මේ යන්ත්‍රවලට කිසි දිනෙක මිනිස් මොළය පැරදවිය නොහැක.

(ආ)පරිගණක තාක්ෂණය හැම ක්ෂේත්‍රයකටම කා වැදී ඇති මේ අවධියේ සමස්ත ලෝකය ම එයට අවනත

වෙමින් පවතී. හුදු පරිගණක තාක්ෂණය කෙරෙහිම නැඹුරු වී සිටීම නිසා සංවර්ධනය වෙමින් පවත්නා රටවල විවිධ සමාජ, ආර්ථික හා සංස්කෘතික ප්‍රශ්න පැන නැඟීමට ඉඩ ඇත. දියුණු වන ලෝකය සමඟ අප ද ඉදිරියට යා යුතුය. එහෙත් එය කළ යුත්තේ චිරස්ථායී ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වෙමිනි.

(ඉ) රටක පවත්නා ස්වභාවික සම්පත් අතර වන ජීවීන්ට හිමිවන්නේ වැදගත් තැනකි. වන සතුන් නැරඹීම සඳහා ම විදේශිකයන් මෙරටට පැමිණෙන බැවින් වන සත්තු විදේශ විනිමය උල්පතකි. කෙටි කාලීන වාසි අපේක්ෂා කරන ආත්මාර්ථකාමීන්, වන සතුන්ට හානි කරන බවට තොරතුරු නිතර නිතර අසන්නට ලැබේ. මේ ජාතික සම්පත ආරක්ෂා කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සතුටට කාරණයකි. මෙහි ලා මහජන සහයෝගය අත්‍යාවශ්‍ය ය.

(ඊ) දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලාංකිකයන් සාරධර්ම සුරැකීම අතින් ශ්‍රේෂ්ඨ ජාතියක් බව විදෙස් ලේඛකයන් පවා පවසා ඇත. එහෙත් වර්තමානය වන විට එහි විශාල පිරිහීමක් දක්නට ලැබීම කනගාටුවට කරුණකි. සාරධර්ම අධ්‍යාපනය තුළින් මේ තත්ත්වය නඟා සිටුවීමට අවධානය යොමු වී ඇත. සමස්ත සිසු පරපුරම පෞද්ගලිකව මේ පිළිබඳව අවබෝධයෙන් කටයුතු කළ යුතු යුගයකි මේ.

(03) පහත සඳහන් ඡේදය වචන 40-50 ත් අතර ගණනකින් යුක්ත වනසේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන සංඛ්‍යාව පිළිතුර අග ලියන්න.

ජලය ආරක්ෂා කිරීමට යොමු වීමෙන් අනාගත ව්‍යසනයන්ගෙන් ලෝකය රැකගත හැකිය. උල්පත් ජලය, වැසි ජලය හා නල ජලය යනුවෙන් ජලය ත්‍රිවිධාකාර වේ. අපගේත් පරිසරයේත් වර්ධනය සඳහා නැතිවම බැරි ජලය කවදා හෝ සිඳී ගිය හොත් ලෝකය එතැනින් නතර වනු ඇත. ඒ අනුව පැවැත්ම සඳහා දායක වනවාද? නැතහොත් විනාශ වී යනවාද? යන ප්‍රශ්නයට පිළිතුර ජනතාව අත පවතී. තමන්ගේ තාවකාලික සහනය වෙනුවෙන් සියල්ල කැපකර නිකරුනේ විනාශ නොවී මඳ කැපකිරීමක් මඟින් ලොව ජයගැනීමට කවුරුත් උනන්දු වන්නට කාලය එළැඹ ඇති බව නොකිව මනාය. මේ සඳහා ක්‍රියා කළ හැක්කේ දියුණුම සත්ත්වයාවන මිනිසාට පමණක් බව ද තරයේ සිහි තබා ගනිමින් ශාක ප්‍රජාව ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කිරීමෙන් ඉහත කී තත්වයන්ට පිළියම් යෙදීම මුහුද හත් ගව්වක් තිබිය දී අමුඩ ගැසීමක් නොවනු ඇත. මේ බව හොඳින් වටහා දීම පරිසර සංවිධාන මඟින් දියත් කරනු ලබන වැඩ පිළිවෙළවල් මඟින් අවධාරණය කළ හැකිය. එය නීතිමය වශයෙන් දියත් කළ යුතුය.

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
තුමූ භූසුරයනැයි කියා ගත් බමුණන්ගේ පාලනයට යටත් වූ ඉන්දියානු රාජ්‍යයෙහි පහත් යැයි සම්මත කුලවල ජනයා ගතකළ ජීවිතය ඉතා කටුක එකක් විය. ක්ෂත්‍රිය බ්‍රාහ්මණ දෙපිරිස හැරුණු විට, ඉතිරි ජනතාව බමුණන් විසින් රවටන ලද රජුන් විසින් දක්කනු ලබන ගවරැළකට නොදෙවෙනි විය. මෙසේ ඉන්දීය සමාජය මුළුමනින්ම වෙලාගෙන ඇති කුලභේදයට පළමු කොටම පහර දෙන ලද්දේ බුදුරජාණන් වහන්සේ විසිනි. ජාතියෙන් කිසිවෙකු උසස් පහත් නොවන බව දේශනා කරමින් සියල්ලන්ගේ මානුෂික නිදහස හා අයිතිවාසිකම් සමාන බව පැහැදිලි කළ උන් වහන්සේ ඉතාම පහත් යයි සම්මත වූ කුලවල මිනිසුන් පවා තම ශාසනයට ඇතුළත් කරගෙන කුලීනයන් ලවා වැන්ද වූහ. බමුණන්ගේ පාරම්පරික මිත්‍යා ගර්වයට පහර දෙමින් උන් වහන්සේ කළ සටනින් පහත් යයි ගැනුණ කුලවල මිනිසුන්ට තම මනුෂ්‍යත්වයේ වටිනාකම අවබෝධ වීම ඉන්දීය ජන සමාජයේ නවලෝකයට කරුණු විය. සමාජයෙහි වූ සෑම වහල් බන්ධනයක් ම කඩා බිඳ දමමින් එකල පැවති සමාජය තත්ත්වයට උඩුයටි කර පෙරළීමෙන් බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද මහා විප්ලවය ලෝක ඉතිහාසයෙන් කිසි කලෙක නොමැකෙන්නකි.

1. කුල භේදය ගැන බුදුන්වහන්සේ කුමක් දේශනා කළෝ ද?
2. ඉන්දීය ජන සමාජයේ නව ලෝකයට හේතු වූයේ කුමක් ද?
3. බුදුන් වහන්සේ කළ මහා විප්ලවය කුමක් ද?
4. ඉන්දීය ජන සමාජයේ පැවති ප්‍රධාන කුල දෙකක් ලෙස මෙහි සඳහන් වන්නේ කුමන කුලද?
5. පහත දැක්වෙන වචන වලට ගැළපෙන විරුද්ධ පද ඡේදයෙන් උපුටා ලියන්න.

i. අසම්මත ii. කුලහීන

(අ) මධ්‍යම පළාතේ දුෂ්කර පාසලක් වන සඳරාජගම පිහිටි සරණංකර ආදර්ශ විද්‍යාලයේ සිසු දරුවන් මෙවර පළාත් මට්ටමේ ජයග්‍රහණ රැසක් ලබා ගෙන ඇත.කිසිදු පහසුකමක් නොමැතිව පුහුණුවීම් කටයුතු කළ මේ දරුවන්ට සමස්ත ලංකා මට්ටමේ තරග සඳහා සහභාගී වීමට අවශ්‍ය පුහුණුවීම් කිරීමට ක්‍රීඩා පිටියක් හා ක්‍රීඩා උපකරණ අවශ්‍යව ඇත. ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන හා පරිත්‍යාගශීලීන් ක්‍රීඩා උපකරණ ලබා දීමට ඉදිරිපත් වී ඇත. අපට අවශ්‍ය ක්‍රීඩා පිටිය සඳහා පාසල පිටුපස ඇති ප්‍රාදේශීය සභාවට අයත් වල් බිහිවී ගිය ඉඩමෙන් කොටසක් වෙන් කර දෙන මෙන් ඉල්ලා ප්‍රාදේශීය සභාවේ සභාපති තුමා වෙත යැවීමට ලිපියක් ලියන්න. ( පාසලේ ක්‍රීඩා නිලධාරි ඔබ යැයි සිතන්න.)

නැතහොත්

(ආ) මහනුවර මහා වීදියේ "සරසි පොත්හල" සාහිත්‍ය මාසය වෙනුවෙන් විශේෂ පොත් ප්‍රදර්ශනය සැප්තැම්බර් මස 7,8 දෙදින තුළ පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත. විශේෂ වට්ටම් සහිතව පොත් ලබාදෙන අතර, පාසල් පුස්තකාල සඳහා 50% ක වට්ටමක් ලබාදේ. සිංහල, දෙමළ, ඉංග්‍රීසි ආදී විවිධ භාෂා පොත් ද , පැරණි සාහිත්‍ය පොත් හා ලිපි ද්‍රව්‍ය ද ඒ අතර වේ. මෙම ප්‍රදර්ශන පැවැත්වීම පිළිබඳ ප්‍රචාරණ කටයුතු සඳහා සුදුසු ආකර්ෂණීය දැන්වීම් පත්‍රයක් වචන 100 කින් පමණ සකස් කරන්න.

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**10 ශ්‍රේණිය** | **වර්ෂ අවසාන පරීක්ෂණය - 2019** | **21 S III**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - III** | **කාලය පැය දෙකයි**

**සැලකිය යුතුයි :-**
- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
- 1,2,3,4 ප්‍රශ්න වලටත් 5,6,7 එක් ප්‍රශ්නයකටත් පමණක් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා නියමිත ලකුණු ගණන 80 කි. .

**● අංක i සිට x තෙක් ඇති සියලුම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

i. " සතුරන්ගෙන් බොහෝ දෙන කුරුබිලියෙන් ඇතුල් නුවරට වදනා හ"
(අ) ඉහත සඳහන් පාඨය ඇතුළත් ජාතක කතාව කුමක් ද?
(ආ) මෙහි "කුරුබිල්ලියෙන්" යන්නෙහි අර්ථය කුමක්ද?

ii. පන්සිළු වීණා නද පසු බැස්වූ
මන් පිනවන වෙණ නදයෙන් තොස්වූ
නන් දන කැන් දුටුව ද බිය සිස්වූ
..........................................................................................

(අ) ඉහත සඳහන් පද්‍යයේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
(ආ) මෙම පද්‍ය ඇතුළත් කෘතියේ රචකයා නම් කරන්න.

iii. (අ) එච්.එම්. කුඩලිගම කවියා අයත් වන්නේ කිනම් සාහිත්‍ය යුගයට ද?
(ආ) මෙම කවියා හඳුන්වන අන්වර්ථ නාමය කුමක් ද?

iv. "ලෙඩට බෙහෙත් කොච්චර තිබුණත් කරුමෙට බෙහෙත් තියෙනවා යැ"

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙය කා හට පවසන ලද්දක් ද?

v. පහත සඳහන් කෘතිවල රචකයන් නම් කරන්න.
(අ) බැද්දේගම නව කතාව
(ආ) සිංහබාහු නාට්‍ය

vi. (අ) "මුනි සිරිපා සිඹිමින්නේ " පද්‍ය පංතිය උපුටා ගත් මුල් කෘතිය කුමක් ද?
(ආ) එහි රචකයා කුමන ජාතිකයෙක් ද?

vii."පටහැනි වෙන්ටා නොව ඔහු අණටා - වෙන මඟ ගැලවෙන්ටා"
(අ) මෙහි ඔහු යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන් ද?
(ආ) මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන් විසින් ද?

viii. ..........................................................................................
..........................................................................................
අනුන් ලියන් දූක තම ලියට තල තලා
දුවන මුවන් දූක නොදමව් නෙළු පලා
(අ) මෙම පද්‍යයෙහි මුල් පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම පද්‍යයෙහි සඳහන් ආප්තෝදේශය උපුටා ලියන්න.

ix. (අ) 'වන සරණ' (Savage Sanctuary) කෘතියේ කතුවරයා නම් කරන්න.
(ආ) මෙම කෘතිය සිංහල බසට පරිවර්තනය කළේ කවුරුන් විසින්ද ?

x. (අ) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් විසින් රචි 'ස්වයං ලිඛිත චරිතාපදානය' කුමක් ද?
(ආ) එතුමන් විසින් රචිත නවකතාවක් නම් කරන්න.

(02) පහත සඳහන් ගද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න.

i. රා විත් ඔඩම් ආදිය පුරවාගෙන පිටත සිටියවුන්ට දික්කොට පුළුගන්වා නැවත තුමූ ම කන්නාහ.

(අ) මේ හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ආ) අංකිත පද වල අර්ථය ලියන්න.

ii. සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැව්වත් බඹහට
සඳැස් සවන් නොකලැයි වූ නොසතුට

(අ) මෙම පද්‍යයේ අදහස සරල බසින් ලියන්න.

(ආ) අංකිත පදවල අර්ථය ලියන්න.

iii. නගරයේ දූලක් මෙන් ඒ මේ අත වැටී තිබුණු පටු පාරවල් ඇගේ භ්‍රාන්තිය දියුණු කැරවී අන්තිමේ දී වෙළඳාම්පලට අවුත් වැටෙන තුරු ඈ නගරයේ ඒ මේ අත ඇවිද්දාය.

(අ) මේ හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ආ) මෙහි සඳහන් උපමාවක් හා අනුප්‍රාසාත්මක යෙදුමක් උපුටා ලියන්න.

iv. තුමුල ගතින්දා - බාහු බෙළෙන්දා
වෙමි සේ - තිදසින්දා
කුරිරු ගිජින්දා - කුඹුතල සින්දා
ලමි සේ - කෙසරින්දා

(අ) සිංහබාහු කෙබඳු පුද්ගලයෙකු ලෙස මෙම කවියෙන් ඔබට හැඟේ ද ?

(ආ) අංකිත පද වල අර්ථය ලියන්න.

v. "පිපාසය ඇති එකෙකුට පැන් පුවහොත් මුත් ඒ පිපාසය නොසන්සිඳෙන්නා සේ ද මේ රජ්ජුරුවන්ට මා මුත් අනෙක් පිළිසරණක් නැත."

(අ) මෙහි රජ්ජුරුවන් හා මා යනුවෙන් කියැවෙන දෙදෙනාගේ නම් ලියන්න.

(ආ)'පැන් පුවහොත්' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(03) උම්මග්ග ජාතක කතාවෙහි සාර්ථකත්වයට හේතු වී ඇත්තේ

i. සරල බස් වහර භාවිතයත්

ii. උචිත උපමා භාවිතයත් ය

සතර කම්මන්ත්‍රණය පාඩම ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

නැතහොත්

i. යහපත් ජීවිතයක් සඳහා ජන කවියෙන් ලද හැකි ආභාෂයත්

ii. උපදෙස් දීමට ජන කවියා තුළ වූ හැකියාවත්

"හානා හීය පානා අඬහැරෙන් දූනේ " පද්‍ය පන්තිය ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පහදන්න.

(04) වීණා වාදනයේ මිහිරියාව ධ්වනිතාර්ථ වන්නේ

i. අවට රැස්වූවන්ගේ ස්වභාවය වර්ණනා කිරීමෙන් හා

ii. උචිත කාව්‍යෝක්තීන් යොදා ගැනීමෙනි.

"ගුත්තිල වෙණ නඳ" පද්‍ය පන්තිය ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

නැතහොත්

i. දාරක ප්‍රේමයෙන් යුතු මවකගේ චරිතයත්

ii. ස්වාමි භක්තියෙන් යුතු බිරිඳකගේ චරිතයත්

සිංහබාහු නාට්‍යයේ එන සුප්පා දේවියගේ චරිතයෙන් නිරූපණය වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් සනාථ කරන්න.

(05) සනාතන මිනිස් චර්යාවෙහි සියුම් අවස්ථා මතු කිරීමට කුඩලිගම කවියා දක්වා ඇති දක්ෂතාවය ගංගාවේ පද්‍ය පන්තිය ඇසුරෙන් උදාහරණ තුන බැගින් දෙමින් විමසන්න.

(06) පාඨක සිත දයානුකම්පාවෙන් පුරවාලීමට සමත් චරිතයකි බැද්දේගම නව කතාවේ සඳහන් පුංචි මැණිකාගේ චරිතය උදාහරණ තුන බැගින් දෙමින් විමසන්න.

(07) දරුවන් තුළ ජාතිකාභිමානය දනවීම හා චරිත සංවර්ධනය ඇති කිරීමේ ලා කවියා ගෙන ඇති උත්සහය සාර්ථක වී ඇත. මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තියෙන් උදාහරණ තුන බැගින් දෙමින් විස්තර කරන්න.

# තෙවන වාර පරීක්ෂණය - 2019
## සිංහල භාෂාව හා සාහිත්‍යය

10 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01 - 2 | 11 - 2 | 21 - 3 | 31 - 2 |
| 02 - 4 | 12 - 4 | 22 - 2 | 32 - 3 |
| 03 - 2 | 13 - 2 | 23 - 1 | 33 - 2 |
| 04 - 2 | 14 - 3 | 24 - 4 | 34 - 3 |
| 05 - 1 | 15 - 2 | 25 - 1 | 35 - 1 |
| 06 - 1 | 16 - 1 | 26 - 2 | 36 - 2 |
| 07 - 3 | 17 - 4 | 27 - 4 | 37 - 1 |
| 08 - 4 | 18 - 1 | 28 - 1 | 38 - 2 |
| 09 - 1 | 19 - 2 | 29 - 3 | 39 - 4 |
| 10 - 3 | 20 - 2 | 30 - 4 | 40 - 2 |

## II කොටස

(01) i. අ - ඌෂ්මාක්ෂර / ඝර්ෂ අක්ෂර
ආ- නාසික්‍ය / වර්ගාන්ත අක්ෂර

ii. අ - විශේෂාංග ආ- වාර්තාවක්

iii. අ - නිරවුල්- ආගම සන්ධිය ආ - නෙළුම් මල් - ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය

iv. අ - අසම්භාව්‍ය ක්‍රියා ආ - විධි ක්‍රියා

v. අ - භෞමික ආ - දෛනික

vi. අ - මා විසින් සැම විටම ගුරුවරු අගය කෙරෙති. / ඇගයෙති/ අගය කරනු ලැබෙති.
ආ- කම්කරුවන් විසින් පාලම තැනුනි / තනා නිම කෙරුණි / තනා නිම කරන ලදි.

vii. අ - සරස්වතිය ආ - කමත / කලවිට

viii. අ - ලෙස ආ- (වි) ශිෂ්ටතම

ix. අ - සිසුහු තිදෙනෙක් විශිෂ්ට සම්මාන හිමි කරගත්හ.
ආ - ඕ තොමෝ ආදරයෙන් මව්පියන් රැකබලා ගත්තාය.

x. අ - අඳුර වැටෙන වේලාව ආ - වට්ටක්කා

(02) ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 25 කි
1. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව ලකුණු 8 යි .
2. සමවිධානය, නිර්මාණාත්මක බව හා ස්වීයත්වය ලකුණු 12 යි.
3. ශිල්පීය දක්‍ෂතා සහ ඡේද බෙදා ලිවීම ලකුණු 05 යි.
(විරාම ලකුණු, වියරණ අත් අකුරු හා පද වෙන් කොට ඡේද බෙදා දැක්වීම)

**සැළකිය යුතුයි :**
1. රචනයේ වචන ගණන දළ වශයෙන් 250 ට අඩු වන කල්හි 1,2,3 යන කොටස්වලට අනුපාතිකව ලකුණක් යොදන්න.
2. වැදගත් සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න.
3. වැරදි අක්ෂර වටා රවුමක් අඳින්න. උක්තාඛ්‍යාතය වැරදි තැන් යටින් ඉරක් අඳින්න.

(03) ප්‍රශ්නයට අදාළ ලකුණ 10 කි.
අදාළ කරුණු සඳහා ලකුණු 06
වචන ගණනට ලකුණු 02
ශිල්පීය දක්‍ෂතා ලකුණු 02
අදාළ කරුණු
1. ජලය හිඟකම අනාගත ව්‍යසනයකි. ල. 01
2. ලොව පැවැත්මට ජලය උපකාරී වේ. ල. 01
3. එය රැකගැනීමට ලෝකවාසීන් උනන්දු විය යුතුය. ල. 01

4. ශාක ප්‍රජාව රැක ගැනීම ප්‍රධාන වගකීම වේ. ල. 01
5. පරිසර සංවිධාන හා රජය මූලිකත්වය ගත යුතු බව ල. 01
6. නීති පද්ධතියක් දියත් කළ යුතුය. ල. 01

ල. 06

(04) ප්‍රශ්නයට අදාළ මුළු ලකුණු 10 කි.
1. ජාතියෙන් කිසිවෙකු උසස් පහත් නොවන බව ලකුණු 02
2. පහත් යයි ගැණුන කුලවල මිනිසුන්ට තම මනුෂ්‍යත්වයේ වටිනාකම අවබෝධ කිරීම.
3. සමාජයෙහි වූ සෑම වහල් බන්ධනයක් ම කඩාබිඳ දමමින් එකල පැවැති සමාජය තත්ත්වයට උඩුයටිකර පෙරළීම
4. බමුණු කුලය, වහල් කුලය
5. අසම්මත - සම්මත කුලහීන - කුලීනී

(05) ප්‍රශ්නයට අදාළ ලකුණු 15 කි.
1. ආකෘතිය- ල. 05 2. අන්තර්ගතය - ල. 07 3. ශිල්පීය දක්ෂතා - ල. 03

1. ආකෘතිය
1. යවන්නාගේ නම ලිපිනය , දිනය ල. 01
2. ලබන්නාගේ තනතුර, ලිපිනය ල. 01
3. ආමන්ත්‍රණය ල. 01
4. මාතෘකාව ල. 01
5. අත්සන, තනතුර ල. 01

2. අන්තර්ගතය
1. ඉඩමේ පිහිටීම ල. 01
2. ක්‍රීඩා භූමිය සඳහා යොදා ගැනීම ල. 01
3. අවශ්‍යතාවය ල. 01
4. ලැබිය හැකි ප්‍රයෝජන ල. 01
5. සංවිධානයේ තොරතුරු ල. 01
6. පරිත්‍යාගශීලීන් ඉදිරිපත් වන බව ල. 01
7. ස්වෙච්ඡා සංවිධානවල සහයෝගය ල. 01

3. ශිල්පීය දක්ෂතා - අත් අකුරු, විරාම ලකුණු, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය - ල. 03

නැතහොත්

අදාළ ලකුණු 15 යි.

1. ආකෘතිය
1. සිත්ගන්නා සුළු මාතෘකාව ල. 01
2. සරල බව හා කෙටි වැකි යෙදීම ල. 01
3. පලකරන්නා හා ලිපිනය දිනය ල. 01
4. නිර්මාණශීලී බව ල. 01
5. ආකර්ෂණීය බව ල. 01

2. අන්තර්ගතය
1. පොත්හලේ නම ල. 01
2. ස්ථානය ල. 01
3. වට්ටම් ල. 01
4. පොත් වර්ග ල. 01
5. විවෘතව තබන දින ල. 01
6. මාසය ල. 01
7. පාසල් පුස්තකාල සඳහා වට්ටම් ල. 01

3. ශිල්පීය දක්ෂතා අත් අකුරු, විරාම ලකුණු, පද බෙදීම හා වියරණ ල. 03

## III කොටස

(01) i. අ - උම්මග්ග ජාතකය ආ - රහස් දොරටුව
ii. අ - මින් රළවුන් ගං වෙරළට රැස්වූ ආ - වැත්තෑවේ හිමියන්
iii. අ කොළඹ යුගයේ දෙවන පරපුර/ නූතන පරපුර ආ - සිංහල ෂෙලී
iv. අ - පුංචිරාළ වෙදරාළ / ඇලුත් මුලාදෑනි ආ - පුංචි මැණිකාට
v. අ - ලෙනාඩ් වුල්ෆ් මහතා ආ - මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්
vi. අ - දරු නැලවිල්ල හෙවත් තොටිල්ල / ජාතික තොටිල්ල
ආ - ටිබෙට් ජාතික

vii. අ - සිංහයා ආ - සිංහබාහු

viii. අ - අඳුරු කරුවලේ පදුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිණිහුල දියේ හෙලා
ආ - දුවන මුවන් දැක නොදමව් නෙළුව පලා

ix. අ- දොස්තර ආර්.එල්. ස්පිට්ල් ආ - ඒ.පී. ගුණරත්න මහතා

x. අ - "පිං ඇති සරසවි වරමක් දෙන්නේ"
ආ - මළගිය ඇත්තෝ / මළවුන්ගේ අවුරුදු දා

(02) 1. i. බ්‍රහ්මදත්ත රජුගේ සේනාව මියලු නුවර වැටලූ අවස්ථාවේ මහෞෂධ පණ්ඩිතයන්ගේ පුරුෂයන් සතුරු සේනාවට පෙනෙන සේ ජයපැන් බොන අවස්ථාව

ii. ඔඩම් - බඳුන් පුළුගන්වා - පොළඹවා

2. i. සතුට උපදවන වීණා නාදය ඇසීම කැම සොයං නොගොස් සිටින මොනර සමූහයා විශේෂ රූපයකින් තමා මැව්වත් තම පිල්වල ඇති ඇස් වැනි ලකුණු කන් බවට පත් නොකලාට මහා බ්‍රහ්මයා කෙරෙහි අසතුට පළකළහ.

ii. මොනර සමූහය
ඇස් වැනි ලකුණු

3. i. තංගල්ල නගරයේ පාරවල් විවිධ දිසාවන්ට දිවෙන බව දැක පුංචිමැණිකා බියට පත්වීම.

ii. නගරයේ දූලක් මෙන්
ඒ මේ අත

4. i. ඉතා විශාල ශක්තිමත් ශරීරයකින් යුක්ත වීම

ii. විශාල ශරීරයකින්
සක්‍රයා

5. i. වේදේහ රජු - රජ්ජුරුවන්
මහෞෂධ පඬිතුමා - මා
පැන් පානය කිරීම / වතුර බීම

(03) 3 හා 4 ප්‍රශ්න සඳහා ලකුණු 15 කි.
උදාහරණ 04 ට ලකුණු 04 යි
සමස්ත විස්තරයට ලකුණු 11 යි
1.සරල බස් වහර

උදා:-
★ මම එක දවසක් රා ටිකක් බී පියනු කැමති ව කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙමි.
★ නුවර ඇතුළෙහි ගී කියන වයන අරගල පිටත සිටි සතුරෝ අසන්නාහ.
★ අපගේ රජ්ජුරුවන් කුමාර කල මෙසේ වූ දොලෙක් විය.
★ කීප දවසක් පැන් නවතාලන්නා පැන් නොලදින් ක්ලාන්ත වූවා හු දොර ඇ පියන්නාහ.
උචිත උපමා භාවිතය

උදා:-
★ පාල්ලෙක ලා ලා පාතටබානා කෙනෙකුන් මෙන්
★ සඳ මඩලේ අඳනා කෙනෙකු මෙන්
★ මඟුල් උයන නඳුන් උයනක් සේ සරසා
★ සිංහ නාද ඇසූ මුව පොල්ලන් පරිද්දෙන්

මෙවැනි කරුණු දෙක බැගින් පෙන්වා ඇත්නම් සාර්ථක පිළිතුරක් සේ පිළිගන්න.

නැතහොත්

<u>යහපත් ජීවිතයක් සඳහා</u>

★ අඳුරු කරුවලේ පදුරට මුවා වෙලා (කවිය)
★ රන් විමනේ සිටිමුත් දුක නැති වෙද්ද ( කවිය)
★ ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද? ( කවිය)
★ මත් උනදාට උන් දන්ඩේ පැණි සේම (කවිය)

ii. ★ වරද පෙනුණ තරමට වැරදුනා නොවේ (කවිය)
★ ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු (කවිය)
★ නහින දෙහින කාලෙට සිත් කෙරුම යුතු (කවිය)

(04) <u>වීණා වාදනයේ මිහිරියාව</u>

උදා:-
★ කන්කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ (කවිය)
★ ගස්සෙන් සිතියම් ගස් සිරි කියෙලී (කවිය)

★ නොදනිත් දරුවන් ඇකයෙන් වැටුණා (කවිය)

★ අතිනම් ගිලිහෙන බව නොම දන්නෝ (කවිය)

★ පැන්දෙන කැන් දුටුව ද බිය සිස් වූ (කවිය)

<u>උචිත කාව්‍යොක්ති භාවිතය</u>

★ රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා (කවිය)

★ පුන් මදාරා මල් දමින් මුදු දිගු සුනිල් වරලස ගොතා (කවිය)

★ දිය දිය ගොඩ සල කරමින් සපැමිණි (කවිය)

නැතහොත්

<u>දාරක ප්‍රේමයෙන් යුත් මවකගේ චරිතය</u>

★ ප්‍රේමවන්ත දරුවෙනි මා - හිඳින කන් යොමා

★ නොකරන් එලෙසා පියතුමගේ අණ - ඉක්මවලා පුතුණේ

★ දරුවන් දෙදෙනා හට සෙත් ලැබෙනා ...

★ නුඹගේද නුඹ නැගණියගේ ද යහපත පිණිස මම නුඹ පියාණන් හැරපියා ....

<u>ස්වාමි භක්තිය</u>

★ සිනිඳු වස්ත්‍ර මිණි අබරණ
තුඹුල මාලිගා
සුවඳ බොජුන් සැප සයනා - මිරිවැඩි සඟලා
මේ සියල්ල හැර දා මම - ආවෙමි වලටා
වෙසෙන ලෙසා ඔබ පිය මා - සමිඳුන් සමඟා

★ මෙවන් බස් දොඩනු කිම
ඔබ පියා හැර දමා
යා හැකි ද ? මේ ලෙසෙන්

★ නොකරන් එලෙසා පියතුමගේ අණ - ඉක්මවලා පුතුනේ

★ දෙවියන් බාරයි මා සමිඳා - මා වෙත නොවනුය කෝපා

★ මා මෙසේ කරන්නේ හද තුළ ඇති මහත් වේදනාවෙනි.
දිවිහිමියෙන් මා ඒ වේදනාවෙන් පෙළෙන්නෙමි.

(05) සනාථන මිනිස් චර්යාවෙහි සියුම් අවස්ථා

උදාඃ- ★ සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි (කවිය)

★ එන්නේ කොහි සිට ද - කොතනකට ද යන්නේ (කවිය)

★ මී අඹ - කිරල - මා දම් ගෙඩි ළදරු වියේ (කවිය)

★ රන්තරු පිරිවරාගත් සඳ මඩල යට (කවිය)

(06) පාඨක සිත් අනුකම්පාවෙන් පුරවාලන පුංචි මැණිකාගේ චරිතය

උදාඃ- ★ පින් තකා ඇයට දුන් කුරක්කන් අහුරු කිහිපයට ඈ බොහෝ වෙසෙවී වැඩ කළාය.

★ පුංචි රාළ පවා කීවේ පුංචි මැණිකා මුවැත්තියක් වගෙයි කියාය.

★ ඈ සිටියේ බබුන් එන්නේ කවදා දැයි පෙරමඟ බලා ගෙනය.

★ බිස්සේ තිබුණු කුරක්කන් ටික ඉක්මණින්ම ඉවරව ගිය හෙයින් කෑ හැකි කොළ වර්ග අල වර්ග හා පළතුරු ද සෙවීමට ඈ වනයට ගියාය.

★ රාළහාමි ඇත්තටම මේ ගැන මොකුත් ආරංචියක් එහෙම දන්නවද? එයා මළයි කියලා

★ ජනාකීර්ණ සමහර ගම් මැදින් බියපත් සිවල් දෙනක මෙන් බියෙන් ඇල ලී ඇකිලී යන විට ....

★ එයා මැරිලා සීයේ

(07) දරුවන් සිත් තුළ <u>ජාතිකාභිමානය ජනිත කිරීම.</u>

උදාඃ- ★ ජාතිය රන් විමනක් වේ (කවිය)

★ මුනි සිරිපා සිඹිමින්නෝ (කවිය)

★ තමන් ලැබූ දිවි පෙවතේ (කවිය)

<u>චරිත සංවර්ධනය</u>

උදාඃ- ★ ඉටු කොට කළ යුතු යුතුකම් (කවිය)

★ මිතුරුකමින් පෙරට එතොත් දුවිල්ලත් එක්ක වුවත් (කවිය)

★ කාටත් හිමි පොදු දේ නම් (කවිය)

★ කරදර දහසක් හමුවේ (කවිය)

සැළිකිය යුතුයි ඃ

3,4,5,6, 7 යන ප්‍රශ්න තහවුරු කිරීමට උචිත නිදසුන් සපයා තිබුණ ද ඒවා නිවැරදි පිළිතුරු ලෙස පිළිගන්න.